# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,963- 2016 අප්‍රේල් මස 12 වැනි අඟහරුවාදා - 2016.04.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | — |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 104 |


*සැ. යු.* - ''සෙත්සඳ යෝගා නිකේතනයේ කාර්ය භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 පෙබරවාරි මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 මැයි මස 06 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 අප්‍රේල් මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/30949.
නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්ගේ අංකය : අනු/11/4/2/07/01(2009).

## අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඊ 449 කණ්ඩලම ග්‍රාම නිලධාරි වසමේ කණ්ඩලම ජනපදයේ 1 පියවර ගමේ පිහිටි ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තු මිනින්දෝරු අනුරේඛණයේ දැක්වෙන (කැ. අ. 913ත් කොටසක්) ප්‍රමාණයෙන් රූඩ් 02 පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් කෘෂිකාර්මික කටයුතු සඳහා මොහොමදු ජලීල් යාසිදීන් මයා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. *ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් :* -

*උතුරට* : එම්. ජේ. පායිසා උම්මා පදිංචි ඉඩම ;
*නැගෙනහිරට* : බදු ඉල්ලුම්කරුගේ වැඩිපුර වගා ඉඩම ;
*දකුණට* : ඉඩමට ප්‍රවේශ වන අතුරු මාර්ග රක්ෂිතය ;
*බටහිරට* : එම්. ජේ. යාසිදීන් පදිංචි වී සිටින ඉඩම.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසි වලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30), (1995.06.15 වැනි දින සිට) ;

*(ආ)* *වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 1995 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි. මෙම බදු මුදල කලින් තිබූ ප්‍රමාණයෙන් 50% ප්‍රමාණයකට අඩු නොවන සේ අවුරුදු පහකට වරක් සංශෝධනය විය යුතු ය.

*දඩ මුදල*.- ඉඩමේ දියුණු වටිනාකමින් 12%කි ;

*(ඇ)* මෙම ඉඩම කෘෂිකාර්මික කටයුත්තක් සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය ;

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත්ගන්නා පරිදි සංවර්ධනය කළ යුතු ය;

*(ඉ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

*(ඊ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(ඌ)* 2015.04.09 වැනි දින සිට අවුරුදු 05 ක අවම කාලයක් ඉකුත් වීමට කලින් අතුරු බදුදීම් කළ නොහැක ;

*(එ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩී. ටී. එම්. ජයතිලක,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2016 මාර්තු මස 16 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, ''මිහිකත මැඳුර'',
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6 හි ,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

04-537

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/26858.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : සීපීසී/එල්සී/එල්ඩී/4/1/28/103.

## අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දමුණුමුල්ල ග්‍රාම නිලධාරි වසමේ දමුණුමුල්ල ගමේ පිහිටි දළ අනුරේඛණයේ දැක්වෙන (අ. ග. පි. 348 කැ. අ. 560, 567, 482 හි කොටසක්) ප්‍රමාණයෙන් පර්. 80 පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් කෘෂිකාර්මික කටයුතු සඳහා විතාරණගේ අමරසිංහ මයා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. *ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් :* -

*උතුරට* : වෙන් කරන ලද පාර ;
*නැගෙනහිරට* : ඩබ්. අමරසිංහ පදිංචි ඉඩම ;
*දකුණට* : යූ. ජී. සියාතුගේ ඉඩම ;
*බටහිරට* : විහාරයේ සිට කනත්තට යන පාර

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසි වලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30), (1995.06.15 වැනි දින සිට) ;
*(ආ)* *වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 1995 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි. මෙම බදු මුදල කලින් තිබූ ප්‍රමාණයෙන් 50% ප්‍රමාණයකට අඩු නොවන සේ අවුරුදු පහකට වරක් සංශෝධනය විය යුතු ය.

*දඩ මුදල*.- ඉඩමේ දියුණු වටිනාකමින් 12%කි ;

*(ඇ)* මෙම ඉඩම කෘෂිකාර්මික කටයුත්තක් සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය ;

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත්ගන්නා පරිදි සංවර්ධනය කළ යුතු ය;

*(ඉ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

*(ඊ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(ඌ)* 2015.04.09 වැනි දින සිට අවුරුදු 05 ක අවම කාලයක් ඉකුත් වීමට පෙර අතුරු බදුදීම් කළ නොහැක ;

*(එ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩී. ටී. එම්. ජයතිලක,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2016 මාර්තු මස 09 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, ''මිහිකත මැඳුර'',
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6 හි ,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

04-536

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/29639.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : පළාත්/ඉකො/ඉ4/කොබෙ/2-27.

## අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් බෙලිවැව පළාත 1316 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඉහලගම ගමේ අ. ග. පි. 1609 හි කැබලි අංක 50 හි කොටසක් (එස්. එච්. ජේ. අමරදීප ඉ. කො. දෙ. මිනින්දෝරු අනුරේඛනයේ) ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0506ක් පමණ වූ රජයේ ඉඩම් කොටස සමිති කටයුතු සඳහා සීමා රහිත බෙලිවැව ඉහළගම ගැමුණු සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමූපකාර සමිතිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :-

| | | |
|---|---|---|
| *උතුරට* | : | අ. ග. පි. 1609 හි කැබලි අංක 50න් කොටසක්; |
| *නැගෙනහිරට* | : | මාර්ගය ; |
| *දකුණට* | : | අ. ග. පි. 1609 හි කැබලි අංක 50න් කොටසක්; |
| *බටහිරට* | : | අ. ග. පි. 1609 හි කැබලි අංක 50න් කොටසක්;. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30), (2015.04.09 වැනි දින සිට ඉදිරියට).

*(ආ)* *වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත ගරු ඇමතිතුමා අනුමත කළ 2015 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2%කි.

වාර මුදල .- නැත;

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම සමිති කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය ;

*(ඈ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය ;

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

*(ඊ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(ඌ)* 2015.04.09 දින සිට වසර 05ක් ගතවන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ ;

*(එ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එස්. ඒ. කලානි එම්. ධනසේකර,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2016 මාර්තු මස 18 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

04-535

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/32227.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : පළාත්/ඉකො/ඉ1/රිදී/ගොවි/01.

**අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 591, මාල්ඹේ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මාල්ඹේ ගමේ අංක 2009/37 සහ 2009.07.01 අනුරේඛනයේ කැබලි අංක ඒ ප්‍රමාණයෙන් පර්චස් 36.2ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් මාල්ඹේ ගොවි සමිතිය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ : -

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 13 ; |
| *නැගෙනහිරට* | : | ප්‍රවේශ මාර්ගය ; |
| *දකුණට* | : | කැබලි අංක 17 ; |
| *බටහිරට* | : | කැබලි අංක 17 සහ 92. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30), (2015.04.09 වැනි දින සිට ඉදිරියට).

*(ආ)* *වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත ගරු ඇමතිතුමා අනුමත කළ 2015 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2%කි.

වාර මුදල .- නැත;

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම සමිති කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය ;

*(ඈ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය ;

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

*(ඊ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(ඌ)* 2015.04.09 දින සිට වසර 05ක් ගතවන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ ;

*(එ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එස්. ඒ. කලානි එම්. ධනසේකර,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2016 මාර්තු මස 23 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

04-660

---

**අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පහත නම් සඳහන් 13 දෙනෙකු විසින්, ඒ හා දක්වා ඇති විස්තර වලට අදාළ ඉඩම් කැබලි නේවාසික කටයුතු සඳහා දීර්ඝකාලීන බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

(අ) බදු කාලය : අවුරුදු තිහයි. (30) (2015.07.03 සිට ඉදිරියට) ;

වාර්ෂික බදු මුදල .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2015 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි.

වාර මුදල .- වාර්ෂික බදු මුදල මෙන් තුන් ගුණයකි;

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය;

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම නේවාසික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය;

(ඈ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

(ඉ) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

(උ) 2015.07.03 දින සිට වසර 05ක් ගත වන තුරු පවුල තුළ පැවරීම් හෝ මෙම ඉඩම බදු ගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ. මෙම බදුකරය සඳහා දීමනා පත්‍රයක් ලබා ගැනීමේ හිමිකම 2015.07.03 දින සිට වසර 05ක් ගත වීමෙන් පසු හිමිවේ ;

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

(එ) නිවාස ඉදිකිරීම් කටයුතු සඳහා ඉඩම අන්සතු කිරීමේ දී නියම කරන ලද කාලසීමාව තුළ නිවාස කටයුතු සම්පූර්ණ කළ යුතු අතර, එසේ කිරීමට අසමත් වුවහොත්, බදු ඔප්පුව අහෝසි වූවාසේ සැලකෙන අතර, රජය වෙත නැවත ඉඩම පැවරීමට සිදුවේ.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එස්. ඒ. කලානි එම් ධනසේකර,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.

2016 මාර්තු මස 24 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, "මිහිකත මැදුර"
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

| අනු. අංකය | ඉ. කො. ජ./ අංකය | නම | ග්‍රාම නිලධාරි වසම | අනුරේඛන අංකය | කැබලි අංකය | ප්‍රමාණය | ඉඩමේ මායිම් උතුරට | නැගෙනහිරට | දකුණට | බස්නාහිරට |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 4/10/39342 | හේරත් මුදියන්සේලා-ගේ විජයසිරි හේරත් | අංක 145, දිවුල්ලෑව | අ. ග. පි. 1854 | M | පර්චස් 20 | කැබලි අංක N | කැබලි අංක V | කැබලි අංක 03 | කැබලි අංක L හා ප්‍රවේශ මාර්ගය |
| 02. | 4/10/39345 | ඒකනායක මුදියන්සේලා-ගේ ශ්‍රියාණි මංගලිකා | අංක 145, දිවුල්ලෑව | අ. ග. පි. 1854 | AM | පර්චස් 20 | පාර රක්ෂිතය | කැබලි අංක AL | කැබලි අංක AB | කැබලි අංක AN |
| 03. | 4/10/39338 | රාජපක්ෂ මුදියන්සේලා-ගේ චන්දන රාජපක්ෂ | අංක 145, දිවුල්ලෑව | අ. ග. පි. 1854 | BX | පර්චස් 20 | ප්‍රවේශ මාර්ග රක්ෂිතය | ප්‍රවේශ මාර්ග රක්ෂිතය | කැබලි අංක BW | කැබලි අංක BU |
| 04. | 4/10/39343 | තුම්පත්තුවේ උණ්ඩියේ රාළලාගේ සුගතපාල | අංක 145, දිවුල්ලෑව | අ. ග. පි. 1854 | AW | පර්චස් 20 | කැබලි අංක AX | කැබලි අංක BA | ප්‍රවේශ මාර්ග රක්ෂිතය | කැබලි අංක AV |
| 05. | 4/10/39314 | රාජපක්ෂ මුදියන්සේලා-ගේ දුමිදු ගුණතිලක | අංක 145, දිවුල්ලෑව | අ. ග. පි. 1854 | AN | පර්චස් 20 | පාර රක්ෂිතය | කැබලි අංක AM | කැබලි අංක AA | පාර රක්ෂිතය |

| අනු අකය | ඉ. කො. ජ./ අංකය | නම | ග්‍රාම නිලධාරි වසම | අනුරේඛන අංකය | කැබලි අංකය | ප්‍රමාණය | ඉඩමේ මායිම් උතුරට | නැගෙනහිරට | දකුණට | බස්නාහිරට |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 06. | 4/10/39315 | කුලතුංග මුදියන්සේලා-ගේ සුනිල් බණ්ඩාර කුලතුංග | අංක 145, දිවුල්ලෑව | අ. ග. පි. 1854 | BP | පර්චස් 20 | ප්‍රවේශ මාර්ග රක්ෂිතය | කැබලි අංක BQ | කැබලි අංක BN සහ BO | කැබලි අංක BL |
| 07. | 4/10/39339 | වන්නිනායක මුදියන්සේලා-ගේ කල්‍යාණි සමන්ලතා | අංක 145, දිවුල්ලෑව | අ. ග. පි. 1854 | N | පර්චස් 20 | පාර | කැබලි අංක U | කැබලි අංක M | පාර |
| 08. | 4/10/39341 | ජයසිංහ මුදියන්සේලා-ගේ චන්ද්‍රපාල ජයසිංහ | අංක 145, දිවුල්ලෑව | අ. ග. පි. 1854 | BT | පර්චස් 20 | ප්‍රවේශ මාර්ග රක්ෂිතය | කැබලි අංක BU | කැබලි අංක BS | කැබලි අංක BQ |
| 09. | 4/10/39316 | තෙන්නකෝන් මුදියන්සේලා-ගේ සුනිල්රත්න බණ්ඩාර | අංක 145, දිවුල්ලෑව | අ. ග. පි. 1854 | AI | පර්චස් 20 | ප්‍රවේශ මාර්ග රක්ෂිතය | කැබලි අංක AH | කැබලි අංක AF | කැබලි අංක AJ |
| 10. | 4/10/39340 | රණසිංහ ආරච්චිගේ ගාමිණී රණසිංහ | අංක 145, දිවුල්ලෑව | අ. ග. පි. 1854 | BV | පර්චස් 20 | කැබලි අංක BU | කැබලි අංක BW | මහව නික-වැව පාර | කැබලි අංක BS |
| 11. | 4/10/39317 | දසනායක මුදියන්සේලා-ගේ ප්‍රියංකා කුමාරි | අංක 145, දිවුල්ලෑව | අ. ග. පි. 1854 | AJ | පර්චස් 20 | ප්‍රවේශ මාර්ග රක්ෂිතය | කැබලි අංක AI | කැබලි අංක AE | කැබලි අංක AK |
| 12. | 4/10/39318 | බුලත්ගේ මුදියන්සේලා-ගේ අනුලාවතී | අංක 145, දිවුල්ලෑව | අ. ග. පි. 1854 | AU | පර්චස් 20 | ප්‍රවේශ මාර්ග රක්ෂිතය | කැබලි අංක AX | කැබලි අංක AV | කැබලි අංක AT |
| 13. | 4/10/39344 | රත්නායක මුදියන්සේලා-ගේ හේරත් බණ්ඩා | අංක 145, දිවුල්ලෑව | අ. ග. පි. 1854 | BB | පර්චස් 20 | කැබලි අංක AZ සහ ප්‍රවේශ මාර්ග රක්ෂිතය | කැබලි අංක BC | ප්‍රවේශ මාර්ග රක්ෂිතය | කැබලි අංක BA |

04-659

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.